(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 1(8).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2025 පෙබරවාරි 07 සිකුරාදා

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2025 පෙබරවාරි 20 බ්‍රහස්පතින්දා)

487/2025

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1984.07.03 සිට 2020.03.18 දක්වා වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයකු ලෙස සේවය කර විශ්‍රාම ගෙන ඇති කහදූව ආරච්චිගේ නිහාල් මහතාගේ විශ්‍රාම වැටුප ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරාපිටිය ශික්ෂණ රෝහල මඟින් මේ දක්වා ඉටුකර නොමැති බවත්;

(ii) ඒ මහතා විශ්‍රාම ගෙන වර්ෂ 05ක් ගත වුවත්, ඔහුගේ විශ්‍රාම වැටුපට අදාළ කටයුතු අවසන් නොකිරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ දුර්වලතාවයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කරාපිටිය රෝහල් අධ්‍යක්ෂකගේ අංක: FQ/02/2018 හා 2023.12.08 දිනැති ලිපිය අනුව පත්කර ඇති මූලික විමර්ශන මණ්ඩලයේ වාර්තාව පිළිගෙන, අදාළ අයකිරීම් කර, විශ්‍රාම කටයුතු සඳහා ලේඛන නිදහස් නොකිරීමට හේතුව;

(ii) එම වාර්තාව සම්බන්ධයෙන් නිහාල් මහතා දැනුම්වත් නොකිරීමට හේතුව;

(iii) ඉහත (i)හි සඳහන් වාර්තාව පිළිනොගන්නේ නම්, ඊට හේතුව;

(iv) එසේ නම්, මේ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග;

(v) එම ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නිහාල් මහතා දැනුම්වත් නොකිරීමට හේතුව;

(vi) 2020 වර්ෂයේ සිට පාකින්සන් රෝගයෙන් පෙළෙන නිහාල් මහතාගේ විශ්‍රාම වැටුප සකස් කිරීම ප්‍රමාද කරන නිලධාරීන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග;

කවරේද යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

2025 මාර්තු 01 සෙනසුරාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

380/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ධීවර වරාය සංඛ්‍යාව කොපමණද;

(ii) එම ධීවර වරාය සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ඇති බහුදින ධීවර යාත්‍රා සංඛ්‍යාව, මේ වනවිට ධීවර කටයුතුවල නිරත වන බහුදින ධීවර යාත්‍රා සංඛ්‍යාව සහ මේ වනවිට ධීවර කටයුතුවල නිරත නොවන බහුදින ධීවර යාත්‍රා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ ඇති එක්දින ධීවර යාත්‍රා සංඛ්‍යාව, මේ වනවිට ධීවර කටයුතුවල නිරත වන එක්දින ධීවර යාත්‍රා සංඛ්‍යාව සහ මේ වනවිට ධීවර කටයුතුවල නිරත නොවන එක්දින ධීවර යාත්‍රා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

385/2025

ගරු වරුණ ලියනගේ මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස රැසක උග්‍ර පානීය ජල හිඟයක් පවතින බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශවල පදිංචි ජනතාව දැඩි දුෂ්කරතාවයන්ට සහ සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දී ඇති බවත්;

(iii) නිසි ජල සම්පාදන ක්‍රමවේදයන් නොමැති වීමෙන් පානීය ජල හිඟය උග්‍ර වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ජල හිඟයට විසඳුමක් ලෙස ක්‍රියාත්මක කරන ලද "විසල් රත්නපුර ජල ව්‍යාපෘතියේ" 2 වන අදියරට අදාළ වැඩ කටයුතු අවසන් කර ඇති ප්‍රමාණය කොපමණද;

(ii) දෙවන අදියර නිම කිරීමෙන් පසු එමඟින් ආවරණය නොවන ප්‍රදේශවලට ජල පහසුකම් සැපයීම සඳහා නව ජල ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(iii) රත්නපුර දිස්ත්‍රික්කයේ මේ වනවිට ක්‍රියාත්මක කරමින් පවතින ප්‍රජා ජල ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iv) නව ප්‍රජා ජල ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

387/2025

ගරු චානක මාදුගොඩ මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාලු වරාය පරිශ්‍රයේ තිබූ බෝ ගස විනාශයට පත්වීම හේතුවෙන් ඒ වෙනුවට ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් රෝපණය කිරීම සම්බන්ධයෙන් ගාලු වරායේ සේවකයන් සහ පාලන අධිකාරිය අතර ඇති මත භේදාත්මක තත්ත්වය පිළිබඳව දැනුම්වත් වී තිබේද;

(ii) එම බෝ පැළය ගාලු වරාය පරිශ්‍රය තුළ රෝපණය කිරීමට ඇති බාධා කවරේද;

(iii) ගාලු වරාය පරිශ්‍රය තුළ එම බෝ පැළය රෝපණය කිරීමට පියවර ගන්නේද;

(iv) ඉහත සඳහන් මත භේදාත්මක තත්ත්වය නිරාකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

418/2025

ගරු අරුණ පනාගොඩ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිටිපන, මාහේනවත්ත ප්‍රදේශයේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක් මීට පෙර තිබුණේද;

(ii) නොඑසේ නම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමක් එම ප්‍රදේශයේ තිබේද;

(iii) එම ඉඩම, කිසියම් පාර්ශ්වයකට විකුණා තිබේද;

(iv) නොඑසේ නම්, විකිණීමේ සූදානමක් තිබේද;

(v) එම ඉඩම විකුණා ඇත්නම්, විකුණන ලද මුළු මුදල කොපමණද;

(vi) එම ඉඩමේ පර්චසයක වටිනාකම කොපමණද;

(vii) රජයේ කටයුතු සඳහා ඉඩම් අවශ්‍යාව තිබියදී, එම ඉඩම බාහිර පාර්ශ්වයකට විකිණීමට හේතු කවරේද;

(viii) එම ඉඩම නැවත රජයට පවරා ගැනීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

452/2025

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගිං ගඟ පිටාර ගැලීම හේතුවෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවිතවලට හා දේපලවලට විශාල බලපෑමක් ඇති කරන බව පිළිගන්නේද;

(ii) 2000 වර්ෂයෙන් පසු ගිං ගඟේ පිටාර ගැලීම පාලනය කිරීම සඳහා හෝ වෙනත් අරමුණක් සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති සම්බන්ධයෙන් වාර්තා සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම වාර්තා කවරේද;

(iv) එම වාර්තා සකස් කරන ලද ආයතන කවරේද;

(v) එම ව්‍යාපෘති වාර්තා/ශක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කිරීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(vi) ඒ සඳහා ප්‍රතිපාදන ලබා ගත් ප්‍රභවයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගිං ගඟේ පිටාර ගැලීම පාලනය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය, අවසන් කරන ලද වර්ෂය, වෙන් කරන ලද මුදල, වියදම් කරන ලද මුදල, ක්‍රියාත්මක කරන ලද ආයතනය සහ ලැබී ඇති විසඳුම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2025 මාර්තු 03 සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

434/2025

ගරු දිනිඳු සමන් මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2020 සිට 2024 දක්වා නිකුත් කරන ලද මුළු මැණික් පතල් බලපත්‍ර සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) එම කාලය තුළදී බලපත්‍ර නිකුත් කරන ලද බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටි මැණික් පතල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම මැණික් පතල් අතරින් වැඩ අවසන් කිරීමෙන් පසු නිසි ප්‍රමිතියට අනුව වසා දමා ඇති මැණික් පතල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම මැණික් පතල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

439/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 29, ගොලුවමුල්ල ග්‍රාම නිලධාරි වසමේ කර්මාන්තපුරයක් ස්ථාපිත කර තිබේද;

(ii) එසේ නම්, එම කර්මාන්තපුරයේ සම්පූර්ණ භූමි ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iii) එම ප්‍රමාණයෙන් මේ වනවිට සංවර්ධනය කර ඇති භූමි ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iv) එම සංවර්ධන කටයුතු සිදු කර ඇති ආයතනය කවරේද;

(v) එම කර්මාන්තපුරයේ මේ වනවිට ස්ථාපිත කර ඇති කර්මාන්ත සහ ඉදිරියේදී ස්ථාපිත කිරීමට නියමිත කර්මාන්ත වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

448/2025

ගරු රුවන් විජේවීර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින මුළු වන අලින් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2020 සිට 2024 දක්වා අලි-මිනිස් ගැටුම් හේතුවෙන් මියගිය වන අලින් සහ වන ඇතුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අලි-මිනිස් ගැටුමට බලපා ඇති මූලික හේතු සාධක කවරේද;

(iv) අලි-මිනිස් ගැටුම කළමනාකරණය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

450/2025

ගරු පද්මසිරි බණ්ඩාර මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිටකොටුව, බැස්ටියන් මාවතේ, කඩ 42ක් විවෘත කිරීමේ උත්සවයේ මාධ්‍ය ආවරණය කිරීම සඳහා සම්පූර්ණ වියදම වන රු. 19,301,403.61ක මුදලෙන් අත්තිකාරම් ලෙස රු. 17,639,938.86ක මුදලක් ටී.ආර්.අයි.ඒ.ඩී. ආයතනය වෙත ලබා දී තිබේද;

(ii) ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර තිබේද;

(iii) ඉහත අත්තිකාරම් මුදල ගෙවීම අනුමත කිරීම සඳහා බලය තිබෙන්නේ කවුරුන් වෙතද;

(iv) එම මාධ්‍ය ආවරණය වෙනුවෙන් ඉහත සඳහන් පරිදි විශාල මුදලක් වියදම් කිරීමේ අරමුණ කවරේද;

(v) ඉහත උත්සවය සම්බන්ධයෙන් මාධ්‍ය ආවරණයක් සිදු කරනු ලැබුවේ නම්, එම මාධ්‍ය ආවරණය රජයේ මාධ්‍ය ආයතනයක් මඟින් සිදු නොකිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

454/2025

ගරු ඔෂානි උමංගා මහත්මිය,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති කර්මාන්තපුර තුළ මේ වනවිට ක්‍රියාත්මක වන කර්මාන්ත සංඛ්‍යාව, ඒවායේ නිෂ්පාදනය සහ අයත් වන ව්‍යාපාර ක්ෂේත්‍රය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) කර්මාන්තපුර තුළ ක්‍රියාත්මක වූ එහෙත් මේ වනවිට වැසී ගොස් ඇති කර්මාන්ත සංඛ්‍යාව කොපමණද;

(iii) කර්මාන්තපුර උපරිම ධාරිතාවයෙන් මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(iv) එම කර්මාන්තපුර තුළ නව කර්මාන්ත ඇරඹීම සඳහා අවකාශ තිබේද;

(v) ශ්‍රී ලංකාවේ ඇති කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංඛ්‍යාව සම්බන්ධයෙන් සංගණනයක් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නව කර්මාන්තපුර ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම් කවරේද;

(iii) ඒ සඳහා ප්‍රාග්ධනය සපයා ගැනීමට අපේක්ෂා කරනු ලබන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2025 මාර්තු 04 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

461/2025

ගරු රුවන් මාපලගම මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අත්තනගල්ල, කළගෙඩිහේන මංසන්දියෙන්, කොළඹ-නුවර ප්‍රධාන මාර්ගයට පිවිසෙන මංගලතිරිය මාර්ගයේ ඉදිකරමින් පවතින පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය, වැඩ අවසන් කිරීමට නියමිත දිනය සහ එය විවෘත කිරීමට නියමිත දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම පාලමේ ඉදිකිරීම් කටයුතු සිදු කරන ලද රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ ආයතන කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු සඳහා මේ වනවිට ගෙවා ඇති මුදල සහ ගෙවීමට ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පාලම නියමිත ප්‍රමිතියට අනුකූලව ඉදිකර තිබේදැයි පරීක්ෂා කර තිබේද;

(ii) එසේ නම්, පරීක්ෂා කරන ලද දිනය සහ පරීක්ෂා කරන ලද්දේ කවුරුන්ද;

(iii) ඉදිකිරීම්වල සිදු වී ඇති අඩුපාඩු (පාලමේ උස, දිග, පළල සහ ඝනකම) සම්බන්ධයෙන් එම ඉදිකිරීම් සිදු කරන ලද ආයතන විසින් වගකීම දරන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

481/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති අරාබි විද්‍යාල කවරේද;

(ii) එම අරාබි විද්‍යාල සඳහා පොදු පාඨමාලාවක් නොමැති අතර එක් එක් විද්‍යාල විසින් විවිධ පාඨමාලා උගන්වන බව දන්නේද;

(iii) එම අරාබි විද්‍යාල සඳහා පොදු පාඨමාලාවක් හඳුන්වා දීමට කටයුතු කර තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා ඇති වැඩපිළිවෙළ කවරේද;

(v) එම පොදු පාඨමාලාව සහ කැමති වෙනත් විෂයයක් හැදෑරීමට අවස්ථාව ලබාදෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

485/2025

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දොන් සයිමන් විජේවික්‍රම සමරකෝන් මහතාට අයත් අක්කර 76ක පමණ විශාලත්වයකින් යුතු කහපොල, රෙජිඩේල්වත්ත නමැති ඉඩම මහා භාරකාරවරයා යටතේ තිබූ බවත්;

(ii) එම ඉඩමේ කොටසක ශාක්‍ය රාජධානියේ අනුරුවක් ඉදිකර, 2017.05.11 වන දින එවකට අග්‍රාමාත්‍යවරයාගේ උපදේශකත්වයෙන් හා එවකට ජනාධිපතිවරයා විසින් විවෘත කරන ලද බවත්;

(iii) "සකල ලෝකවාසී බෞද්ධ ජනයා වෙත අසමසම තිළිණයක්" ලෙස ඊට අදාළ එලකයේ සඳහන් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉදිකිරීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) එම ඉදිකිරීමේ වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

488/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1992 වර්ෂයේදී ආරම්භ කරන ලද ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ආරම්භ කරන ලද දිනයේ සිට මේ දක්වා අයත් වී ඇති රේඛීය අමාත්‍යාංශය/අමාත්‍යාංශ කවරේද;

(ii) වර්ෂ 2010 සිට 2015 දක්වා, වර්ෂ 2015 සිට 2019 දක්වා සහ වර්ෂ 2019 සිට 2024 දක්වා යන එක් එක් කාල සීමාවේ පැවති ආණ්ඩුවලදී ඉහත ආයතනය අයත් වූ රේඛීය අමාත්‍යාංශය/අමාත්‍යාංශ භාරව කටයුතු කරන ලද අමාත්‍යවරයා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් අමාත්‍යවරයා යටතේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව එම එක් එක් ව්‍යාපෘතියේ නම සහ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත ව්‍යාපෘති අතරින් මේ දක්වා වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

489/2025

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේදී ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් මැණික් පතල් කැණීම හා ගැරීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මැණික් පතල් කැණීම හා ගැරීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම බලපත්‍ර, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව නිකුත් කරන්නේද;

(iv) පතල් කැණීමේ පවතින අවිධිමත්භාවය හේතුවෙන් සිදු වන පරිසර හානිය වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

2025 මාර්තු 05 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

7/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුහුණු සංචාරක කාර්යාංශය විසින් මදුනාගල සංචාරක ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙන බව දන්නේද;

(ii) එමඟින් මදුනාගල උණු දිය උල්පත් යොදා ගෙන හද සම්භාහනය (හෘද පුනර්ජීවනය) කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා ඉදිකරන ලද ගොඩනැගිල්ල සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මේ වනතෙක් අවසන් කර නොමැති බැවින් එම ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය යටතේ මදුනාගල සංචාරක කලාපයේ ඉදිකරන ලද ආපනශාලාව, විවේකාගාරය සහ භෝජනාගාරය වෙනුවෙන් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විශාල මුදලක් වැය කර ඉදිකරන ලද සංචාරක බංගලාවේ ඇති විදුලි ජනක යන්ත්‍ර ක්‍රියා විරහිත වී ඇති අතර එහි වහල අබලන් වී ඇති බව දන්නේද;

(iii) එහි ඉදිකරන ලද ගැමි කඩමණ්ඩිය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) මේ වනවිට එම කඩමණ්ඩිය නටඹුන් වී ඇති බව දන්නේද;

(v) එම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

70/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර්-පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කලුවන්කේනි-2 ප්‍රදේශයේ, සී-නෝර් නිවාස යෝජනා ක්‍රමය නමින් නිවාස යෝජනා ක්‍රමයක් 1982 වර්ෂයේදී ඉදිකරන ලද බව දන්නේද;

(ii) එම නිවාස/ඉඩම් සඳහා හිමිකම් ඔප්පු මේ දක්වා ලබා දී නොමැති වීම හේතුවෙන් එම නිවාස/ඉඩම්වලට විදුලිය සහ පානීය ජල පහසුකම් ලබා ගැනීමේදී ඒවායේ පදිංචිකරුවන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන බව දන්නේද;

(iii) එසේ නම්, එම නිවාස/ඉඩම්වලට හිමිකම් ඔප්පු ලබා දීමට පියවර ගන්නේද;

(iv) එම ඔප්පු ලබා දෙන කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

91/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වෙළඳ පොළේ පරිභෝජනයට නුසුදුසු ප්‍රමිතියෙන් තොර පොල්තෙල් ඇති බවට හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ප්‍රමිතියෙන් තොර පොල්තෙල් වෙළඳ පොළට නිකුත් කරනු ලබන ආකාරය කවරේද;

(iii) ඒ සඳහා භාවිතා කරනු ලබන උපක්‍රම කවරේද;

(iv) ඒවා වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(v) උසස් ප්‍රමිතියෙන් යුතු පොල්තෙල් වෙළඳ පොළට නිකුත් නොවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුඩා හා මධ්‍ය පරිමාණ පොල්තෙල් මෝල් හිමිකරුවන් මුහුණ දෙන ගැටලු කවරේද;

(ii) එම ගැටලු සඳහා දෙනු ලබන විසඳුම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

490/2025

ගරු සුනිල් රත්නසිරි මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ‘‘පොළොන්නරුව සිටි සෙන්ටර්’’හි ඇති මුළු කඩකාමර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට බදු දී ඇති කඩකාමර සංඛ්‍යාව කොපමණද;

(iii) ‘‘පොළොන්නරුව සිටි සෙන්ටර්’’ ගොඩනැගිල්ල බදු දීම සහ එහි ඇති කඩකාමර බෙදා දීම සම්බන්ධයෙන් 2019 වර්ෂයේදී ආණ්ඩුකාරවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේදී ගනු ලැබූ තීරණ කවරේද;

(iv) මේ වනවිට එම තීරණ ක්‍රියාත්මක වන්නේද;

(v) ඉහත කඩකාමර බදු දීමෙන් පොළොන්නරුව මහා නගර සභාවට අලාභයක් සිදු වී තිබේ නම්, එම අලාභය අදාළ පාර්ශ්වයන්ගෙන් අය කර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

491/2025

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිල්වලා ගඟේ ඉදිකර ඇති ලවණ බාධකය හේතුවෙන් පැන නැගී ඇති සමාජ, ආර්ථික හා පාරිසරික ගැටලු පිළිබඳ අධ්‍යයනය කර වාර්තාවක් ලබා දෙන ලෙස 2024.11.08 සිට 2025.01.14 දක්වා වූ කාලය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව හෝ ජල සම්පත් මණ්ඩලය විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඉල්ලීමක් කර තිබේද;

(ii) එසේ නම්, ඉහත ඉල්ලීම සම්බන්ධයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් තාක්ෂණික කමිටුවක් පත් කර තිබේද;

(iii) එසේ නම්, එහි සාමාජිකයන් කවුරුන්ද;

(iv) මේ වනවිට එම කමිටුවේ කටයුතුවල ප්‍රගතිය කවරේද;

(v) එම කමිටුවේ වාර්තාව ලබා දෙනු ලබන දිනය කවරේද;

(vi) ඉහත කමිටුව මේ දක්වා පත් කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

2025 මාර්තු 06 බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

84/2024

ගරු රෝහණ බංඩාර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.01.01 දින සිට මේ දක්වා ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ආයතනයේ ගුවන්යානා ප්‍රමාද වීම් සහ ගුවන් ගමන් අවලංගු කිරීම් සංඛ්‍යාව එක් එක් මාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ හේතුවෙන් එම ආයතනයට දැරීමට සිදු වූ අමතර පිරිවැය කොපමණද;

(iii) ඉහත සඳහන් ගුවන්යානා ප්‍රමාද වීම් සහ ගුවන් ගමන් අවලංගු කිරීම් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

104/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 නොවැම්බර් 14 සිට 2024 නොවැම්බර් 13 දක්වා කාලය තුළදී ආනයනය කරන ලද සහල් ප්‍රමාණය කොපමණද;

(ii) එම කාලසීමාව තුළදී රජය විසින් සහ පෞද්ගලික අංශය විසින් ආනයනය කරන ලද සහල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2024 වර්ෂයේ පැවති ජනාධිපතිවරණයෙන් පසුව ශ්‍රී ලංකාවට සහල් ආනයනය කර තිබේද;

(iv) එසේ නම්, එම ප්‍රමාණය, රජය විසින් සහ පෞද්ගලික අංශය විසින් ආනයනය කරන ලද සහල් ප්‍රමාණය ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සහල් ආනයනය කිරීමට හේතු කවරේද;

(vi) එම සහල් කිලෝවක ආනයනික මිල කොපමණද;

(vii) එම සහල් වෙළඳ පොළ වෙත නිකුත් කරන ලද මිල කොපමණද;

(viii) එම සහල් පාරිභෝගිකයා වෙත අලෙවි කරන ලද මිල කොපමණද;

(ix) එම සහල් සඳහා රජය විසින් අය කරන ලද බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

124/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලට දායකත්ව මුදල් ගෙවිය යුතුව තිබෙන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම සහ ගෙවිය යුතුව තිබෙන දායකත්ව මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම මුදල් අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

189/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ජපන් ආධාර මත ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති අතරින් මේ වනවිට අතරමඟ නැවතී ඇති ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iii) එම ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

390/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී ස්ථාපිත කරන ලද දූෂණ විරෝධී කමිටු කාර්යාලය එවකට අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ ස්ථාපිත කරනු ලැබුවේද;

(ii) එම කමිටුව ස්ථාපිත කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය සහ අමාත්‍ය මණ්ඩල තීරණය ඉදිරිපත් කරන්නේද;

(iii) එම කමිටුවේ සිටි සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) දූෂණ විරෝධී කමිටු කාර්යාලය වසා දමන අවස්ථාව වනවිට එම කාර්යාලය වෙත ලැබී තිබූ පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(vi) පවරා තිබූ නඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම දූෂණ විරෝධී කමිටුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කරන ලද පුද්ගලයාගේ නම සහ ලිපිනය කවරේද;

(ii) ඔහු අනවසරයෙන් වාහනයක් ධාවනය කර එය අනතුරකට පත් කර ඇති බව දන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

2025 අප්‍රේල් 11 සිකුරාදා

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 2/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයින්, හිටපු රාජ්‍ය නායකයන් හා එම වැන්දඹුවන් භුක්ති විඳින වරප්‍රසාද සුදුසු පරිදි කප්පාදු කිරීම,— ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයින්, හිටපු රාජ්‍ය නායකයන් හා එම වැන්දඹුවන් භුක්ති විඳින වරප්‍රසාද පිළිබඳව මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයන් හි මෙන්ම මෙරට ජන සමාජය තුළ කථිකාවක් ඇති වී තිබෙන හෙයින්, රටේ පොදු ජනතාවගේ ඉල්ලීමට සවන්දෙමින් ඔවුන්ගේ අපේක්ෂාවන් සඵල කිරීම පිණිස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට, හිටපු රාජ්‍ය නායකයන්ට හා එම වැන්දඹුවන්ට විරාත් කාලයක් ලබා දී තිබූ වරප්‍රසාද සුදුසු පරිදි අඩු කිරීම, ඉවත් කිරීම හෝ ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරයන්ගෙන් සාධාරණ පිළිතුරක් පාර්ලිමේන්තු සභාව තුළ දී සාකච්ඡා කොට ලබා ගැනීමට රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 3/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවකාශ සලසා දීම,— ශ්‍රී ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ Z- අගය මත පදනම් නොවී ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය නෛතික හා උසස් අධ්‍යාපනික ව්‍යුහය රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යා පීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක්

ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යා පීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට එවකට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 පෙබරවාරි 13 දින ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සලකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, බදුල්ල සහ හම්බන්තොට ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම,— රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින්, රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘති අඛණ්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංග ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2024

ගරු රෝහණ බංඩාර මහතා,— අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම සහ බෙදා හැරීම සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීම ඉහළ නැංවීමේ වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ඖෂධ හා වෙනත් ද්‍රව්‍ය ආනයනය කිරීමේ ක්‍රියාවලිය පුද්ගලයන් කිහිපදෙනෙකු අත රඳා පැවතීම නිසා ජනතාවට විවිධ අසීරුතාවයන්ට මුහුණදීමට සිදුවී තිබෙන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීම ඉහළ නැංවීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2024

ගරු රෝහණ බංඩාර මහතා,— සමුපකාර ග්‍රාමීය බැංකු පද්ධතිය නිසි අධීක්ෂණයකට ලක් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට ඉතාම සමීප සමුපකාර ග්‍රාමීය බැංකු රැසක් පසුගිය කාලයේ දී විවිධ හේතු මත බිඳ වැටීමෙන් එහි තැන්පත්කරුවන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දී සිටින හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා එම බැංකු රජය විසින් නිසි අධීක්ෂණයකට ලක් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයේ පත්වීම් ලබාදීම විධිමත් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ ඔසවා තබන විදේශ සේවය සඳහා සිදු කරන ලද දේශපාලන පත් කිරීම් හේතුවෙන් එම සේවයේ ගුණාත්මකභාවය බිඳ වැටී අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබෙන හෙයින් එම තත්ත්වය වළක්වාලීම සඳහා විදේශ සේවයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම් තරඟ විභාග ප්‍රතිඵල සහ කුසලතාවය මත සිදු කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කිරීම,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් නොමැති වීම, ලංකා ගමනාගමන මණ්ඩලයේ පවතින දූෂිත තත්ත්වයට ප්‍රධාන හේතුවක් වන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල රාමුවෙන් බැහැරව, රැකියා වෙළඳපොළ හා වෘත්තීය තාක්ෂණය ඉලක්ක කොටගත් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාඨමාලා පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— විගණන වාර්තා මඟින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— රජයේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල සිදුවන විවිධ මූල්‍යමය වංචා පිළිබඳව විගණන වාර්තා මඟින් කරුණු හෙළි කරන හෙයින්, එවැනි වංචා හා දූෂණ රාජ්‍ය ආයතනවල සිදුවීම වැළැක්වීම සඳහා එම වාර්තා මඟින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා සතු විෂයයන් විද්‍යානුකූල ක්‍රමවේදයකට සකස් කිරීම,— වර්තමානය වනවිට පළාත් සභා සතු විෂයයන් කිසිදු විද්‍යානුකූල පදනමක් නොමැති ආකාරයකට වෙන් කර තිබෙන හෙයින් ද, එමඟින් විවිධ ගැටලු මතු වී තිබෙන හෙයින් ද, මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා එම විෂයයන් විද්‍යානුකූල පදනමක් මත නිසි ක්‍රමවේදයකට වෙන් කර දැක්වීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංකා ගමනාගමන මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් හෙයින්, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී සිදුවන වංචා හා දූෂණ වළක්වා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— කිරි නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වාර්ෂිකව කිරි ආනයනය කිරීම සඳහා විශාල වශයෙන් විදේශ විනිමය මෙරටින් බැහැර වන හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ජාතික නිෂ්පාදනයට පශු සම්පත් ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය ඉහළ නැංවීම,— ශ්‍රී ලංකාවේ ජාතික නිෂ්පාදනයට පශු සම්පත් ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම ජීවත්වීමට නිවසක් ලබා දීම,— ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම ජීවත් වීමට නිවසක් හිමි විය යුතු වන බැවින්, සෑම ගෘහමූලිකයෙකු හටම තම ආරක්ෂාව සහ යහ පැවැත්ම උදෙසා නිවසක් මිලදී ගැනීම, ඉදිකිරීම හෝ කුලියට ගැනීම සඳහා සවිබල ගන්වමින් ඔහු හෝ ඇය හට පහසුකම් සැලැස්විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දේශපාලනීකරණයෙන් තොර කිරීම,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දැඩි ලෙස දේශපාලනීකරණය වී ඇති බව පෙනී යන බැවින්, ඡන්දයෙන් තේරී පත් වන දේශපාලනඥයින් ක්‍රීඩා ආයතනවල නායකත්ව තනතුරු සඳහා තරග කිරීම සහ ඒවා හෙබවීම තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/2024

ගරු රවී කරුණානායක මහතා,— සෑම තරුණයෙකුම ඵලදායි රැකියාවක නියුතු පුද්ගලයෙකු හෝ ස්වයං රැකියාවක නියුතු ව්‍යවසායකයෙකු බවට පත් කිරීම,— වයස අවුරුදු 18 සම්පූර්ණ කරන සෑම තරුණයෙකුටම ඵලදායි රැකියාවක නියැලීමේ අයිතිය තිබිය යුතු අතර, රැකියාවක නිරත නොවන්නේ නම්, ස්වයං රැකියාවක නියුතු ව්‍යවසායකයෙකු බවට පත්වීම සඳහා මූල්‍ය ආධාර ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.